**සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව - 2023**

**----------------------------------------------------------**

සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ (“සමාගම”) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනත සමග කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2007 අංක 07 දරන සමාගම් පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2019 වර්ෂයේ සිට 2023 දක්වා වූ මූල්‍ය ප්‍රකාශන 2024 නොවැම්බර් 25 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

සමාගමේ මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් (SLFRS for SMEs) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම මණ්ඩලයේ වගකීම වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති හා අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි ඇතුළත් අත්පොතෙහි 6.6 ඡේදය පරිදි ගිණුම් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව විසින් 2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වර්ෂ 4 යි මාස 08 ක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි.<br><br>සමාගම විසින් භාවිතා කරනු ලැබූ පරිගණක සර්වර් යන්ත්‍රය 2019 වර්ෂයේ දී වෛරස් ආක්‍රමණයක් හේතුවෙන් අක්‍රීය වූ බවත් එම අවස්ථාවේ දත්ත උපස්ථවල (Backups) ගබඩා කර නොතැබීම හේතුවෙන් ගිණුම් පිළියෙල කිරීමට අවශ්‍ය තොරතුරු නොමැති බව දක්වමින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. 2022 අප්‍රේල් 19 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග මත මේ සම්බන්ධයෙන් 2022 අප්‍රේල් 28 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කර තිබුණද එම වාර්තා සම්බන්ධයෙන් වර්තමාන තත්වය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සඳහා 2023 ඔක්තෝබර් 27 දින ලබා දී ඇත. 2019, 2020, 2021 සහ 2022 මූල්‍ය ප්‍රකාශන මේ වන විට කෙටුම්පත් කර ඇත.<br><br>2019 වර්ෂයේ අක්‍රීය වූ පරිගණක පද්ධතිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිදු කළ පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කොට ඒ පිළිබඳව වාර්තාවක් 2024 මාර්තු 04 දින දක්වා ලැබී නොමැත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 පවත්නා වත්කම් හා වගකීම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් 2018 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාගමේ වත්කම් රු. මිලියන 549.05 ක් ද, වගකීම් රු. මිලියන 1479.27 ක් ද , හිමිකම් රු. මිලියන (930.22) ක් ද, ආදායම් රු. මිලියන 222.68 ක් ද හා වියදම් මිලියන (184.82) ක් ද විය. | විකුණුම් වැඩිදියුණු කරගැනීමත්, ආයතනය සතුව දැනට ඇති සම්පත් වඩා කාර්යක්ෂම ලෙස යොදාගැනීමත් අරමුණු කරගත් නව ව්‍යාපාරික සැලැස්මක් පිළියෙළ කර, එයට අනුගතව ලාභදායී ආයතනයක් බවට පරිවර්ථනය කරගැනීමට අපේක්ෂා කෙරේ. | සමාගමේ වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කිරීමට හා වගකීම් පියවා මූල්‍ය පිරිවැය අවම කර ලාභය වර්ධනය කර ගැනීමට කලමනාකරණය මෙහෙයුම් කටයුතු සැලසුම් කල යුතුය. |
| (ආ) | සමාගමේ 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සමාගමේ ශුද්ධ ලාභ අනුපාතය (3.5) සිට (75) දක්වා අඩු වී තිබුණි. | විකුණුම් ප්‍රමාණය (sales volume) ඉහළ නැංවීම හා ආයතනික වියදම් කළමනාකරණය කරගනිමින් ආයතනය ලාභදායී තත්වයට නැවත පත්කරගැනීමට සැළසුම් සකස් කොට අවශ්‍ය පියවර ගනු ලැබේ. | සමාගමේ ලාභ අනුපාතය ක්‍රමානුකූලව හා උපයමාර්ගිකව ඉහල නංවා ගැනීම සඳහා කඩිනම් පියවර ගැනීම කලමනාකරණයේ වගකීම බව. |

### 2.2 අභ්‍යන්තර පාලනය

සමාගමෙහි ගැනුම්, විකුණුම් ක්ෂේත්‍රයන් සඳහා හඳුන්වා දී ඇති අභ්‍යන්තර පාලන පද්ධතීන් ඉතා දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය වූ අතර ඒ පිළිබඳ විගණනයේදී හෙළිදරව් කරගත් කරුණු පහත පරිදි වේ.

#### 2.2.1 භාණ්ඩ මිලදී ගැනුම්

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහාත්, ප්‍රමාදයන් අවම කිරිම සඳහාත්, ජනතාව සඳහා මූල්‍යමය වශයෙන් වඩාත්ම වාසිදායක සහ ගුණාත්මකභාවයෙන් ඉහළම වැඩ සහ සැපයුම් ලබා ගැනිමට සමාගම කටුයුතු කර නොතිබුණු අතර 2023 ජනවාරි 30 දිනැති අංක 296 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව නිළධාරීන් 05 බැගින් සමන්විත කමිටු 02ක් ප්‍රසම්පාදන තීරණ ගැනීම වෙනුවෙන් පත්කර තිබුණි. | නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලියට පටහැනි නොවනසේ ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ආයතනය සඳහා මිලදී ගැනීම් සිදු කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) අනුව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු විෂය යටතට ගැනෙන සියලු ප්‍රසම්පාදන සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පිහිටුවා තිබිය යුතු වුවත් සමාගමේ ප්‍රසම්පාදන තීරණ ගැනීම උදෙසා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පිහිටුවා නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) ට අනුව මිලට ගැනීම් සඳහා අවශ්‍ය විෂය පිළිබඳ විශේෂඥයෙකුගේ ඇගයීම් ලබාගෙන නොතිබුණි. | නව අධ්‍යක්ෂ මණ්ඩලය පත්වූ පසු, අදාල තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රසම්පාදන කමිටු මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට වහාම පියවර ගනු ලැබේ. | සමාගම විසින් මිලදී ගැනීම් සිදුකිරීමේදී 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 අනුව ලංසු කැඳවීමේ ලේඛනවල වෙළඳ නාමයන් සඳහන් නොකළ යුතු බවට කොන්දේසි ඇතුලත් කර තිබුනද, 2023 වර්ෂය තුල රු. මිලියන 16.78 ක් වටිනා භාණ්ඩ මිලට ගැනීමේදී වෙළඳ නාමය පදනම් කර ගනිමින් මිල කැඳවුම් සිදු කොට තිබුණ අතර සංස්ථාව තම ප්‍රසම්පාදන තීරණ ගැනීමේදී එම සන්නාමය පමණක් පදනම් කොට ගෙන තිබුණි. | ගැණුම්කරුවන් විශේෂයෙන් සන්නාම සඳහන් කරන අවස්ථා වලදී හැර වෙනත් කිසිදු අවස්ථාවක මිලදී ගැනීම් වලදී වෙළඳ සන්නාම සඳහන් නොකිරීමට පියවර ගනු ලැබේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කල යුතුය. |
| (ඈ) | සැපයුම්කරුවන් සඳහා ගෙවීම් කිරීමේදී, ඉන්වොයිසිය, භාණ්ඩ ලැබීම් පත්‍රිකා, මිලට ගැනුම් ඇනවුම් සියල්ල පරීක්ෂා කර ගෙවීම් වවුචරය පිළියෙල කොට පරීක්ෂා කර මුදල් ගෙවීම සඳහා අනුමැතිය ලබා දිය යුතු වුද, සමාගම විසින් ගැනුම් ඇනවුම සමඟ වටිනාකමින් සියයට 50 ක් ගෙවීම් සිදු කර තිබුණි. | සැපයුම්කරුවන් ගෙන් භාණ්ඩ ලබා ගැනීමේ දී ණය පදනම මත ලබා ගැනීමේ දුෂ්කරතාවන් පැන නැගීම හේතුවෙන් මෙලෙස සමාගම විසින් ගැනුම් ඇනවුම සමග සියයට 50 ක කලින් ගෙවීම් සිදු කර තිබුණි. | සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමේදී නිසි පරිදි භාණ්ඩ ලැබීම් තහවුරු වූ පසු ගෙවීම් සිදුකල යුතුය. |

**2.2.2 භාණ්ඩ විකුණුම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂය සඳහා සංස්ථාවේ ගිණුම් අංශයෙන් ඉදිරිපත් කල වාර්තාවට අනුව විකුණුම් ආදායම රු. මිලියන 469.56 ක් වූ අතර අලෙවි අංශයෙන් ඉදිරිපත් කල වාර්තාවට අනුව විකුණුම් ආදායම රු.මිලියන 418.36 ක් විය. ඒ අනුව මෙම අංශ දෙක අතර විකුණුම් ආදායමේ රු. මිලියන 51.30 ක වෙනසක් නිරීක්ෂණය විය. | අලෙවි අංශයෙන් ලද විකුණුම් දත්ත සහ මූල්‍ය අංශයේ ගිණුම් ගත කරන ලද විකුණුම් දත්ත අතර පවතින වෙනස තහවුරු කර ගැනීම සඳහා අදාල සැසඳුම් සිදු කෙරෙමින් පවතී. | නිරවද්‍ය විකුණුම් ආදායම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | අලෙවි මධ්‍යස්ථාන 19 ක 2022 වර්ෂයේ විකුණුම් ආදායම රු. මිලියන 3,324.18 ක් වූ අතර 2023 වර්ෂයේ විකුණුම් ආදායම රු. මිලියන 418.36 ක් විය. 2022 වර්ෂය හා | 2022 වර්ෂයේ ටයිල් ආනයනය කිරීමේ විශේෂ අවස්ථාවක් ආයතනය වෙත හිමි වීම මත වැඩි විකුණුම් | විකුණුම් ආදායම් වර්ධනය කර ගැනීමට විකල්ප උපාය මාර්ග හඳුනා ගත යුතුය. |

| | | |
|---|---|---|
| සැසඳීමේදී රු. මිලියන 2,905.82 ක , එනම් සියයට 87 ක විකුණුම් ආදායම අඩුවීමක් නිරීක්ෂණය විය. | මට්ටමක් කරා ලඟා වීමට හැකි විය. 2023 වර්ෂයේ ආරම්භයත් සමග එම ව්‍යාපෘති කටයුතු අවසන් වූ බැවින් එදිනෙදා සාමාන්‍ය විකුණුම් අලෙවි ශාඛා මගින් ක්‍රියාත්මක විය. | |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ සම්බන්ධයෙන් තහවුරු කිරීම් සහ යාවත්කාලීන කරන ලද කාල විශ්ලේෂණයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2024 ජූනි 30 දිනට ලැබිය යුතු මුදල් එකතුව රු. මිලියන 453.60 ක් සහ බාහිර පාර්ශවයන්ට නිරවුල් කළ යුතු බැරකම් එකතුව රු. මිලියන 471.98 ක් වී තිබුණි. | 2023 වර්ෂයට අදාල තොරතුරු 2025 අගෝස්තු මාසය තුළ දී ඔබ ආයතනය වෙත ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. කෙටි කාලීන ණය හිමියන් වෙනුවෙන් ගෙවීම් කටයුතු කිරීම පිළිබඳව සැලැස්මක් සකස් කර අවශ්‍ය කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ පිළිබඳ යාවත්කාලීන තොරතුරු වාර්තා පවත්වාගෙන යාමට හා වර්ෂාවසාන ශේෂ තහවුරු කර ගනිමින් කඩිනමින් අයකර ගැනීමට කළමනාකරණය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | | | |
| i. | ආයතනය විසින් විධිමත් අනුමැතියකින් හා විධිමත් ක්‍රමවේදයකින් තොරව වැටුපෙන් අයකර ගැනීමේ පදනම මත සමාගමේ සේවකයින්ට ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා දී තිබූ අතර 2024 අගෝස්තු 30 දින වන විට රු. මිලියන 1.38 ක් සේවකයින් 13 දෙනෙකුගෙන් අයවීමට තිබුණි. ණය පදනමට භාණ්ඩ ලබා දීම සඳහා කිසිඳු අනුමැතියක් නොතිබුණු අතර, මෙම භාණ්ඩ බාහිර පාර්ශවයන්ට විකුණා එකවර මුදල් ලබා ගත හැකිව තිබූ අවස්ථා අහිමි වී ගොස් තිබුණි. | සාමාන්‍යාධිකාරීතුමාගේ අනුමැතිය ලැබී ඇත.මෙම මුදල් කොටස් වශයෙන් අයකර ගැනීමට පියවර ගනු ලැබේ. | ලැබිය යුතු ණය ශේෂයන් කඩිනමින් අයකර ගත යුතුය. |
| ii. | එක් වරක් ලබා දුන් භාණ්ඩ වෙනුවෙන් වූ වටිනාකම අය වීමටත් පෙර කිසිඳු සීමාවකින් තොරව එම පුද්ගලයාටම නැවතත් භාණ්ඩ ලබා දී තිබුණි. | මෙවැනි තත්වයන් නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | ණය පදනම මත භාණ්ඩ සැපයීමේදී අනුමත ක්‍රමවේදයක් යටතේ සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2004 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා සේවක අර්ථසාධක අරමුදල් නියමිත පරිදි නොගෙවීම නිසා අධිකරණ නියෝග මත රු. මිලියන 3.98 ක අධිභාරයක් ගෙවීමට නියම විය. මාසිකව රු.50,000 බැගින් එකතුව රු.මිලියන 2.85 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබූ අතර තවදුරටත් රු. මිලියන 1.13 ක ශේෂයක් ගෙවිය යුතු විය. | තව දුරටත් රු. මිලියන 1.13 ක මුදලක් ගෙවීමට ඇත. | හිඟ සේවක අර්ථසාධක අරමුදල් කඩිනමින් ගෙවීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | 2007 සැප්තැම්බර් 27 දිනැති අමප/07/1625/342/021 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොළඹ 10 ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් ඉඩමකින් පර්චස් 100 කින් යුත් බිම් කොටසක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පවරා රු. මිලියන 50 ක අත්තිකාරම් මුදලක් 2008 පෙබරවාරි 22 දින සමාගම වෙත ලැබී තිබුණි.<br><br>ලබාගත් අත්තිකාරම් මුදල ආපසු ගෙවිය යුතුව තිබුණද, සමාගම විසින් මෙම රු. මිලියන 50 දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | මෙම අත්තිකාරම් මුදල ආපසු ගෙවීම සම්බන්ධව, නව අධ්‍යක්ෂ මණ්ඩලය පත්වූ පසු තීරණයක් ලබාගැනීමට කටයුතු කරනු ලැබේ | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අත්තිකාරම් මුදල් ආපසු ගෙවීමට කටයුතු කල යුතුය. |

## 2.4 දිගු කාලීන හා කෙටිකාලීන ණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීමේ අරමුණින් සමාගම විසින් රුපියල් මිලියන 150 ක කෙටිකාලීන ණය මුදලක් 2017 මාර්තු 02 දින සිට 2018 අප්‍රේල් 10 දින දක්වා කාල පරිච්ඡේදය තුල අවස්ථා 03 කදී මහජන බැංකුවෙන් ලබාගෙන තිබුණි. මෙම ණය මුදල දීමේ අරමුණ නොතකා සමාගමේ පරිපාලන වියදම් ද ඇතුළුව වෙනත් වියදම් ද මෙම ණය මුදලින් මේ වන විට දරා තිබුණි.<br><br>කෙසේ වුවද මෙම ණය මුදල නියමිත පරිදි පියවීමට සමාගම අපොහොසත් වී තිබුණු බැවින් 2023 අගෝස්තු 22 දිනට ගෙවිය යුතු ණය මුදල සහ උපචිත වූ පොලියද සමඟ මුළු හිඟ මුදල රුපියල් මිලියන 226.46 ක් වූ අතර ඒ වෙනුවෙන් ගෙවිය යුතු දඩමුදල රුපියල් මිලියන 19.07 ක් විය. | අමාත්‍යාංශයේ උපදෙස් මත හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව මෙම ණය ගෙවා දැමීම සම්බන්ධව අදාල බැංකුව සමග එකඟතාවයකට පැමිණීමට කටයුතු කරනු ලැබේ. | ණය ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ණය මුදල් උපයෝජනය කර ණය පියවීමට ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් කළමනාකරණය වගකිව යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූලා දුෂ්කරතා ජයගනිමින් ඉදිකිරීම් කර්මාන්තයේ ශක්තිමත් පාර්ශවකරුවකු වීමට සමාගමට හැකි වනු පිණිස භාණ්ඩාගාර ඇපයක් මත 2018 මාර්තු 28 දිනැති හා අංක අමප/18/0504/736/007 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් ලංකා බැංකුව විසින් රුපියල් මිලියන 500 ක ණය මුදලක් 2018 ඔක්තෝබර් 23 දින සමාගම වෙත ලබා දී තිබුණි. එයින් එදින වන විට ලංකා බැංකුවට අයවීමට තිබූ රු. මිලියන 199.05 ක් වූ මුදලක් අඩුකර ගෙන ඉතිරි මුදල වූ රු. මිලියන 301.38 ක් ආයතනයට ලබා දී තිබුණි. එයින් සියයට 35 ක් එනම් රු. මිලියන 105.98 ක් ණය ලබා ගැනීමේ අරමුණට පටහැනි වියදම් වූ සේවක වැටුප් ගෙවීම්, සේවක අර්ථසාධක / භාරකාර අරමුදල් ගෙවීම්, අනෙකුත් පරිපාලන වියදම්, ණය පොළී ගෙවීම්, අයිරා පියවීම, උත්සව අත්තිකාරම් වෙනුවෙන් වැය කර තිබුණි. | එවකට පැවති කළමණාකාරිත්වයේ තීරණය මත මෙම ගෙවීම් සිදුකළ බව වාර්ථා වේ. ණය ලබා ගන්නා අරමුණට පටහැනිව වියදම් කිරීම ඉදිරියේදී සිදු නොකරනු ඇත. | ණය මුදල් ලබාගන්නා අරමුණ වෙනුවෙන් යෙදවීමට කළමනාකරණය පියවර ගත යුතුය. |
| (ඇ) | මෙම රු.මි. 500 ක ණය මුදලේ 2023 දෙසැම්බර් 28 දිනට හිඟ පොළී මුදල රු. මිලියන 321.14 ක් විය. එමෙන්ම අවුරුදු 05ක සහන කාලය 2023 ඔක්තෝබර් 23 දින අවසාන වන අතර ඉන්පසු ණය මුදලෙහි ප්‍රාග්ධන කොටස නියමිත පරිදි ගෙවිය යුතුව ඇතත් ඒ සම්බන්ධයෙන් ගෙවීම් සැලැස්මක් ඉදිරිපත් නොවුණි. | මෙම ණය ගෙවා දැමීම සම්බන්ධව අදාල බැංකුව සමග එකඟතාවයකට පැමිණීමට කටයුතු කරනු ලැබේ. | විධිමත් ක්‍රමවේදයක් හා සැලසුමක් යටතේ බැංකු ණය මුදල ගෙවා අවසන් කිරීමට සමාගම කටයුතු කල යුතුය. |

## 2.5 ප්‍රසම්පාදන කළමණාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් භාවිතා කරමින් පවතින මෘදුකාංග පද්ධතිය කාර්යක්ෂම නොවීම හේතුවෙන් නව පරිගණක පද්ධතියක් මිලදී ගැනීම සඳහා 2021 වර්ෂයේදී ආයතන 05 කින් සීමිත මිල ගණන් කැඳවා තිබුණි. මේ සඳහා වූ පිරිවිතරයන් ආයතනය විසින් පිළියෙල කර තිබුණු නමුත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදනයන් සිදු කළ යුතුය. |
| (ආ) | මිලගණන් කැඳවූ ආයතන 05 න් දෙකක් පමණක් මිලගණන් එවා තිබූ අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8 | ඉදිරි ගනුදෙනු වලදී තාක්ෂණික ඇගයීම් කමිටුව නිවැරදි ආකාරයට පත්කර | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව |

| | | | |
|---|---|---|---|
| | වගන්තියට අනුකූල නොවූ සාමාජිකයන් 07 දෙනෙකුගෙන් සැඳුම්ලත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් එක් සමාගමක් වෙත රු. මිලියන 6.91 ක වටිනාකමකට අදාළ මෘදුකාංග පද්ධතිය මිලදී ගැනීමට නිර්දේශ කර තිබුණි. එසේ ඉදිරිපත් කරන ලද මිලගණන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ මාර්ගෝපදේශ වලට අනුව කටයුතු කරනු ඇත. | ප්‍රසම්පාදනයන් සිදු කළ යුතුය. |
| (ඇ) | 2024 අගෝස්තු 15 විගණිත දින දක්වාම සමාගමට උචිත පරිගණක මෘදුකාංගයක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සමාගමෙහි විකුණුම්, ගැනුම් හා බැංකු ශේෂයන්හි දත්ත ඇතුලත් කිරීමේදී විශාල වශයෙන් දෝෂ නිරීක්ෂණය විය. | මෙම කරුණු පිලිබඳව අධ්‍යයනය කර පවතින පරිගණක මෘදුකාංගය යාවත්කාලීන කිරීමට හෝ නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ නව මෘදුකාංගයක් මිලදී ගැනීමට පියවර ගනු ලැබේ. | සමාගමේ පවතින පරිගණක මෘදුකාංගය යාවත්කාලීන කිරීමට හෝ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව නව මෘදුකාංගයක් මිල දී ගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | **අග්‍රාමාත්‍ය/ පස්වන විධායක ජනාධිපති නිල නිවසේ අළුත්වැඩියා හා නවීකරණය**<br><br>2021 ඔක්තෝබර් 26 දිනැති අංක අමප 21/1779/302/002/-1 අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අග්‍රාමාත්‍ය / පස්වන විධායක ජනාධිපති නිල නිවසේ අළුත්වැඩියා හා නවීකරණ කටයුතු සඳහා අනුමැතිය ලබා දී තිබුණු අතර අළුත්වැඩියා හා නඩත්තු කිරීමට අදාලව සමාගම විසින් රු. මිලියන 639.22 ක් වටිනා ඉන්වොයිස් 2024 මැයි 14 දින වන විට නිකුත් කර තිබුණි. | | |
| i. | මෙම නවීකරණ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ගිවිසුම්ගතවීමක් නොමැතිව රු. මිලියන 13.07 ක මුදලක් ගෙවමින් තෝරාගනු ලැබූ ගෘහ නිර්මාන ශිල්පීන්ගේ වාචික උපදෙස් මත මෙම ව්‍යාපෘතියට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට ඔවුන් විසින් නම් කරනු ලැබූ සැපයුම්කරුවන් 16 දෙනෙකුගෙන් තරඟකාරි මිල කැඳවීමකින් තොරව ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ගැනුම් ඇනවුම් මත මෙම නිල නිවාස ව්‍යාපෘතියට භාණ්ඩ නිකුත්කර ඉන්වොයිස් කර තිබුණි. | ඉදිරියේ දී මෙවැනි ආකාරයේ ගනුදෙනු වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කෙරෙනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව සැපයුම්කරුවන් තෝරා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. | ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 1,196.25 ක් වටිනා ඉන්වොයිස්පත් නිකුත්කර තිබුණ ද මේ තුළ රු. මිලියන 557.03 ක ව්‍යුවර්පත් සාවද්‍ය ලෙස යොදා තිබුණු අතර මෙමඟින් සමාගමෙහි විකුණුම් අගය වැඩිකර දක්වා තිබුණි. | ආයතනික මට්ටමින් මේ සම්බන්ධව තොරතුරු අනාවරණය කරගැනීමට අභ්‍යන්තර විගණන අංශයට යොමු කර ඇත. | සත්‍ය ඉන්වොයිස් වටිනාකම මත හඳුනා ගත් නිරවද්‍ය විකුණුම් වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් කල යුතුය. |

## 2.6 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ ටයිල් ව්‍යාපෘතිය යටතේ 2021 සැප්තැම්බර් මාසයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා රු. මිලියන 2,924.73 ක විකුණුම් ආදායමක් ලබා තිබුණද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ අයකර ගත් එකතු කළ අගය මත බදු රු. මිලියන 129.59 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. | 2021 වර්ෂයේ 4 වන කාර්තුවට අදාළ දත්ත ඇතුළත් කරමින් පවතින අතර එය අවසන් වූ පසු තෙවන හා සිව්වන කාර්තුවලට අදාළ එකතු කල අගය මත බදු වටිනාකම බදු වාර්තා (vat return) හි ගැළපුම් කර අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. | එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව අය කර ගත් බදු මුදල් වහාම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුය. |
| (ආ) | කොළඹ මහනගර සභාව වෙත ගෙවිය යුතු 2007 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා හිඟ වරිපනම් බදු මුදල් රු.මිලියන 19.24 ක් සහ ඊට අදාල දඩ මුදල රු. මිලියන 4.34 ක් 2023 දෙසැම්බර් 31 දින දක්වාම නිරවුල් කර නොතිබුණි. | ආයතනයේ මූල්‍ය තත්ත්වය අනුව ඉදිරි කාලය තුලදී එම බදු මුදල් ගෙවා දැමීම සම්බන්ධව මහ නගර සභාව සමග එකඟතාවයකට එළඹීමට අපේක්ෂා කෙරේ. | කඩිනමින් ගෙවිය යුතු වරිපනම් බදු පිළිබඳව අදාළ පළාත් පාලන ආයතනය සමඟ එකඟතාවයකට පැමිණීමට කටයුතු කල යුතුය. |

## 2.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 6.7 ඡේදය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකොට එම වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ සිදු කරමින් පවතී.<br><br>අධ්‍යක්ෂ මණ්ඩලය පත් වූ පසු එහි අනුමැතිය සමග අදාල වාර්තා විගණනයට භාර දීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව භාණ්ඩ සමීක්ෂණය නියමිත දිනට සිදුකොට වාර්තා |

| | | | | |
|---|---|---|---|---|
| | | | | විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (ආ) | භාණ්ඩාගාර ලේකම්ගේ අංක MF/CG/02/(Cir) හා 2017 ජුනි 28 දිනැතිව නිකුත් කර ඇති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 | සමාගම විසින් කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2024 වර්ෂය අවසානයට පෙර කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිබඳ තොරතුරු භාණ්ඩාගාරයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත භාර දෙනු ඇත. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය. |

## 2.8 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමෙහි භාවිතය සඳහා පිරිවැය රු.මිලියන 26.29 ක් වූ වාහන 05ක් අමාත්‍යාංශය විසින් වර්ෂ 2018 සිට 2021 අතර කාලසීමාව තුල භාර දී තිබුණු අතර එම වාහන ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින අතර 2024 අගෝස්තු 16 දින වන විටත් අළුත්වැඩියා කිරීමට හෝ නැවත අමාත්‍යාංශය වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි. | එම වාහන අමාත්‍යාංශය වෙත නැවත භාර දීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | කලමනාකරණය විසින් අමාත්‍යාංශය වෙත වාහන භාරදීමට කටයුතු කළ යුතුය. |

## 2.9 අවිධිමත් ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් ත්‍රිකුණාමලය, කුලියාපිටිය, කුරුණෑගල හා තංගල්ල අලෙවි මධ්‍යස්ථාන කුළී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල පවත්වාගෙන යමින් පැවති අතර තංගල්ල අලෙවි මධ්‍යස්ථානය සඳහා රු. 35,000 ක මාසික කුළියක්ද, කුරුණෑගල හා කුලියාපිටිය අලෙවි මධ්‍යස්ථාන සඳහා රු. 30,000 ක කුලියක්ද, | ඉදිරියේ දී අලෙවි මධ්‍යස්ථාන කුළී පදනම මත ලබා ගැනීමේ දී විනිවිදභාවයෙන් යුතුව මේ පිළිබඳ උනන්දුවක් දක්වන සියළුම පාර්ශවයන්ට අවස්ථාවක් ලබා දීමට කටයුතු කරනු ඇත. | තරඟකාරි ලංසුකරුවන් අතුරින් ප්‍රශස්ත සැපයුම්කරු තෝරා ගැනීමේදී උනන්දුවක් දක්වන සියළුම පාර්ශවයන්ට |

| | | | |
|---|---|---|---|
| | ත්‍රිකුණාමලය අලෙවි මධ්‍යස්ථානය සඳහා රු. 25,000 ක් බැගින්ද ගෙවීමට සමාගම සහ ගොඩනැගිලි හිමිකරුවන් සමඟ ගිවිසුම් ගත වී තිබුණි. එසේ වුවද මෙම ගොඩනැගිලි තෝරාගත් ක්‍රමවේදය ලිපිගොනු පරීක්ෂාවේදී විගණනයට නිරීක්ෂණය නොවූ අතර මෙම තෝරාගැනීමේදී විනිවිදභාවයෙන් යුතුව මේ පිළිබඳ උනන්දුවක් දක්වන සියළුම පාර්ශවයන්ට අවස්ථාවක් ලබාදුන්නේද යන්න තහවුරු නොවීය. | | සහභාගී වීමට අවස්ථාවන් ලබා දිය යුතුය. |
| (ආ) | මෙම කුලී මුදල් තක්සේරු කරනු ලැබුවේ කුමන තක්සේරුවක් මත පදනම්වද යන්න විගණනයට තහවුරු නොවීය. 2022 වර්ෂයට පිළියෙල කර තිබූ කෙටුම්පත් මාසික ගිණුම් වලට අනුව ත්‍රිකුණාමලය, තංගල්ල, කුලියාපිටිය හා කුරුණෑගල අලෙවි මධ්‍යස්ථානයන් 2022 වර්ෂය තුල ලබා තිබූ අලාභයන් පිළිවලින් රු. මිලියන 0.12, රු. මිලියන 1.82, රු. මිලියන 0.41 හා රු. මිලියන 0.82 ක් විය.<br><br>2023 වර්ෂයේ කෙටුම්පත් මාසික ගිණුම් පිළියෙල නොකිරීම හේතුවෙන් එම වර්ෂයේ අලාභය හඳුනාගත නොහැකි විය.<br><br>2023 අප්‍රේල් 25 දිනැති අංක 4.2/199 දරන කළමණාකරු - මානව සම්පත්/ වැ.බ. සාමාන්‍යාධිකාරීගේ ලිපියට අනුව 2023.01.30 දින පැවති අංක 296 වෙනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තංගල්ල හා කුරුණෑගල අලෙවි මධ්‍යස්ථාන වසා දැමීමට තීරණය කර ඇති බව අදාළ ඩිපෝ කළමණාකරුවන් දැනුවත් කර ඇතත් 2024 ජූලි මාසයේදී අදාළ අලෙවි මධ්‍යස්ථාන වෙනුවෙන් කුලී ගෙවීම් කර තිබුණි. | පැරණි ගිවිසුම් මත කුලී මුදල් ගෙවයි.<br>තංගල්ල හා කුරුණෑගල අලෙවි මධ්‍යස්ථාන වසා දැමීමට 2023 ජනවාරි මස තීරණය කර ඇතත් මේ දක්වා පවත්වගෙන ගොස් ඇති බැවින්, මෙම තීරණය නව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් නැවත සමාලෝචනය කර තීරණයක් ගනු ලැබේ. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව අලාභ ලබන අලෙවි මධ්‍යස්ථාන වසා දැමීමට කටයුතු කල යුතුය. |

## 2.10 අරමුණට පටහැනි වූ ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ටයිල් ව්‍යාපෘතිය<br><br>රටෙහි විදේශ විනිමය අර්බුදය හේතුවෙන් ආනයන සීමා පනවා ඇති අවස්ථාවක වෙළඳපලෙහි ටයිල් හිඟය අවම කර ගැනීමේ අරමුණින් ටයිල් ආනයනය කිරීමේ අවසරය 2021 ජූනි 11 දිනැති අංක 2231/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සමාගමට පමණක් ලබාදී තිබුණි. ඒ අනුව සමාගමට ආනයන කටයුතු කිරීමට තරම් මූල්‍ය ශක්තියක් නොමැති වීම හේතුවෙන් එම ව්‍යාපාරයෙහි යෙදී සිටින එම ද්‍රව්‍ය අලෙවියට කැමැත්තක් දක්වන සමාගම් සමඟ අවබෝධතා ගිවිසුම් වලට එළඹ "BMC" නමින් ඔවුන්ගේ මුදලින් ටයිල් ආනයනය කර විකුණා ලැබෙන ලාභයෙන් 1/3 ක් සමාගමටද 2/3 ක් ආයතනය වෙනුවෙන් මුදල් යොදවන හවුල්කාර සමාගමටද වශයෙන් බෙදාගැනීමට එකඟව තිබුණි. ටයිල් ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2023 ජූනි 30 දක්වා කාල සීමාව තුළ සිදුකර තිබූ ටයිල් ආනයන වටිනාකම රු. මිලියන 928.88 ක් ද වූ අතර විකුණුම් වටිනාකම රු. මිලියන 2,695.82 ක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) 2024 අගෝස්තු 26 දිනට ආනයනික ටයිල් සඳහා සංස්ථාවට ලැබිය යුතු ලාභ වටිනාකම රු. මිලියන 64.84 ක් සහ ආනයනික වියදම් සංස්ථාවෙන් දැරීම හේතුවෙන් සංස්ථාවට අය විය යුතු රු. මිලියන 22.92 ක් ද ඇතුළුව ලැබිය යුතු මුළු වටිනාකම රු. මිලියන 87.76 ක් විය. ඒ වෙනුවෙන් සැපයුම්කරුවන්ට නොගෙවා රඳවා ගෙන ඇති විකුණුම් වටිනාකම රු. මිලියන 36.37 ක් අඩු කල විට තව දුරටත් අය විය යුතු ශේෂය රු. මිලියන 51.38 කි. සංස්ථාව සතු නොවිකිණී ඉතිරිව ඇති ටයිල් තොගයේ වටිනාකම රු. මිලියන 6.46 ක් පමණි. | ටයිල් ව්‍යාපෘතිය මගින් අයවිය යුතු ශේෂයෙන් රු. මිලියන 22.92 ක මුදලක් විදේශ මුදල් ප්‍රේෂණ වෙනස වන අතර එය පසුගිය වර්ෂයන්හි හටගත් ඩොලර් අර්බුදය හේතුවෙන් හටගත් අගයකි.එම හේතුවෙන් ටයිල් ව්‍යාපෘතියෙහි ලාභ ප්‍රතිශතය 30%-45% දක්වා වැඩි කිරීම තුළින් සමස්ථ ලාභය රු. මිලියන 174.90 කින් වැඩි වී ඇත. අයවිය යුතු ලාභ වටිනාකම් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරගෙන යනු ලැබේ. | අයවිය යුතු ලාභය අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | “BMC” නමින් ටයිල් ආනයනය කරනු ලැබුවද ඇනවුම් කරනු ලබන සියලුම ඇනවුම් පිළිබඳව සමාගම දැනුවත් වී නොතිබුණි. ටෙලිග්‍රැෆික් ට්‍රාන්ස්ෆර් හරහා ආනයන කටයුතු සිදු කිරීමට ගිවිසුම්ගත වී තිබුණද ඊට පටහැනිව ඔවුන්ගේ ගිණුමකින් මුදල් ගෙවා සමාගම කිසිදු දැනුවත් කිරීමකින් තොරව ආනයනය කර තිබුණු ඇමෙරිකානු ඩොලර් 154,928.27 ක් වටිනා ටයිල් තොගයද වරායෙන් නිදහස් කර ගැනීමට සමාගම ක්‍රියාකර තිබුණු අතර මේ සඳහා විදේශ විනිමය දිවයිනෙන් බැහැර කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලද අවසරයද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ටයිල් ආනයනය කරනු ලබන පුද්ගලික සමාගමක් සහ විදේශ ටයිල් සැපයුම්කරු වන පුද්ගලික සමාගමක් අතර පවතින දිගුකාලීන ව්‍යාපාරික සම්බන්ධතාවය මත EX21220636,EX21220637,EX21220680 සහ EX21220681, SC 64 යන ඉන්වොයිස්හි ඩොලර් වටිනාකම 154,928.27 ක මුදල සැපයුම්කාර සමාගම විසින් ගෙවීම ප්‍රතික්ෂේප කරන බවට සමාගම වෙත ලිඛිතව දන්වා එවා ඇති අතර පසුකාලීනව ශ්‍රී ලංකා මහ බැංකුවෙන් හෝ නෛතිකව ගැටලුවක් ඇති වුවහොත් ඒ හා සම්බන්ධව සියලු වගකීම ටයිල් ආනයනය කරනු ලබන පුද්ගලික සමාගම විසින් භාරගන්නා බවට දිවුරුම් පෙත්සමක් මගින් සමාගම වෙත භාර දී ඇති බවට අනාවරණය වුණි. | ගැසට් පත්‍රයේ අරමුණුවලට අනුකූලව ක්‍රියා කරන බවට සමාගමේ කලමනාකරණය විසින් තහවුරු කල යුතුය. |
| (iii) | විදේශ විනිමය සංචිත හිඟවීම හේතුවෙන් 2023 ජනවාරි 01 දිනැති අංක 2312/78 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සෙරමික් ටයිල් ආනයනය නැවත අත්හිටුවා තිබියදී සමාගම විසින් ඒ පිළිබඳ නොතකා පුද්ගලික නිවාස ව්‍යාපෘතියක් වෙනුවෙන් ටයිල් ආනයනය කළ සමාගමකට හා පුද්ගලික ගොඩනැගිල්ලක පළමු මහළ නවීකරණය සඳහා ටයිල් ආනයනය කළ සමාගමකට අවසර ලබා දී තිබුණි. තවද එම ආයතනය විසින් ආනයනය කළ ටයිල් තොගයෙන් ටයිල් 1500 ක ප්‍රමාණයක් 2023 ජුලි 06 දින සමාගම වෙත කිසිදු ලාභයක් හෝ බදු මුදලක් අය කිරීමකින් තොරව නිදහස් කරගැනීමට සාමාන්‍යාධිකාරීගේ අනුමැතියෙන් ඉඩදී තිබුණි. | BMC ටයිල් ව්‍යාපෘතියට අදාළවන ගැසට් නිවේදනයේ පැනනැගුණු ගැටළුකාරී තත්ත්වය හේතුවෙන් 2023.05.16 දින ආනයනික ටයිල් තොගය වරායෙන් නිෂ්කාශණය කර ගැනීම මාසයකට අධික කාලයක් ප්‍රමාද වීම නිසා පුද්ගලික සමාගමකට දැරීමට සිදුවූ ප්‍රමාද ගාස්තු ප්‍රමාණය ඉහළ වීම මත මූල්‍යමය වශයෙන් අසීරු තත්ත්වයකට මුහුණ දී ඇති බවත් දන්වමින් සහ ගිවිසුම් ප්‍රකාරව සමාගමෙහි ලාභ කොටස සහ ඔවුන්ට අදාළ බදු මුදල පළමුව ලබාදිය නොහැකි බවත් එය ඊළඟ විකුණුම් ආදායමේදී ලබාදෙන බවටත් ලිඛිතව පොරොන්දු වූ බවත් එම ඉල්ලීම සැළකිල්ලට ගනිමින් සහ එම සමාගම විසින් ගෙන්වන ලද ටයිල් තොගයෙන් 5860 ක ටයිල් තොගයක් අලෙවිය සඳහා ඉතිරිව ඇති නිසාත් ටයිල් 1500 ක ප්‍රමාණයක් සඳහා වන අලෙවි ආදායම ඔවුන් වෙත ලබා දීමට ඉඩ දෙන ලදි. | ගැසට් පත්‍රයේ කොන්දේසිවලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (iv) | ගිවිසුම් අනුව භාණ්ඩ නිෂ්කාශනය කිරීමෙන් පසු පළමු කොට සමාගමේ ලාභ කොටස සැපයුම්කරු විසින් සමාගම වෙත ගෙවිය යුතුව තිබුනද ඒ අනුව කටයුතු නොකිරීම තුල විගණිත දින වන 2024 අගෝස්තු 16 දින වන විට සමාගමට ලැබිය යුතු ලාභ කොටස රු.මිලියන 3.41 ක් වූ අතර සමාගම සතු | පුද්ගලික සමාගමක් වෙතින් සමාගම වෙත තව දුරටත් අයවිය යුතු වටිනාකම රු. මිලියන 6.99 ක් වන අතර මෙයින් රු.මිලියන 5.10 ක් විදේශ මුදල් ප්‍රේෂණ වෙනස වන අතර ලාභ ප්‍රතිශතය 30% - 45% දක්වා වැඩි කිරීම තුළින් එම සමාගම වෙතින් රු. මිලියන 11.01 ක වැඩි ලාභයක් ජනනය වී ඇති බව දැන ගන්නට ලැබිණි. | අයවිය යුතු වටිනාකම තුළ අන්තර්ගත විදේශ මුදල් ප්‍රේෂණ වෙනස සම්බන්ධයෙන් කඩිනමින් තීරණයක් ලබා |

| | | |
|---|---|---|
| පුද්ගලික සමාගමේ ටයිල් තොග වටිනාකම රු.මිලියන 2.18 ක් විය. මිට අමතරව සැපයුකරුගේ ආනයන වියදම්ද සමාගම දැරීම හේතුවෙන් සමාගමට අය විය යුතු රු. මිලියන 5.10 ක් ද ඇතුළුව ලැබිය යුතු මුළු මුදල රු.මිලියන 8.51 ක්ව තිබියදී සැපයුම්කරුට නොගෙවා රඳවාගෙන තිබූ රු.මිලියන 5.01 ක් සමාගමට ලැබිය යුතු ලාභ කොටස් සඳහා හිලවු කර ගෙන තිබුණි. ඒ අනුව 2023.07.13 දිනට සමාගමේ වාර්තාවල පෙන්වන ලද රු. මිලියන 6.53 ක රඳවා ගත් වටිනාකම රු.මිලියන 1.52 ක් දක්වා අඩු කර ගෙන තිබුණි. | එම මුදල හැර තව දුරටත් සමාගම වෙත අයවිය යුතු මුදල වනුයේ රු. මිලියන 1.89 කි. පුද්ගලික සමාගමෙහි තොග වටිනාකම රු.මිලියන 2.18 ක් වන අතර ඔවුන්ගෙන් අයකරගත යුතුව ලෙස පවතින රු.මිලියන 5.10 ක විදේශ මුදල් ප්‍රේෂණ වෙනස සම්බන්ධයෙන් තවමත් අවසන් තීරණයකට එළඹ නොමැති බවට අනාවරණය වුණි. | ගෙන අයවිය යුතු වටිනාකම අයකර ගත යුතුය. |
| (ආ) **ආදර්ශ ගම්මාන වැඩසටහන සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවෙන් ද්‍රව්‍ය නිකුත් කිරීම** | | |
| 2015 සිට 2021 වර්ෂය දක්වා වූ වර්ෂ 7 ක කාලපරිච්ඡේදය තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ සූරිය පොකුණ දෙබොක්කාව නිවාස ව්‍යාපෘතියේ නිවාස හිමියන්ට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය ණය පදනම මත සංස්ථාවෙන් නිකුත් කර තිබුණි. සංස්ථාවට අයත් අම්බලන්තොට, තංගල්ල, ලුණුගම්වෙහෙර, තිස්ස, වීරකැටිය, ඇඹිලිපිටිය, සූරියවැව, යන ශාඛා ගබඩාවන්ගෙන් රු. මිලියන 34.69 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය සීමාවක් නොමැතිව නිකුත් කර තිබුණි. 2024 අගෝස්තු 30 දින වන විට තවදුරටත් නිරවුල් නොවූ ණය ශේෂය රු. මිලියන 26.59 ක් වූ අතර එක් නිලධාරියෙකුගේ නමින් රු. මිලියන 10 ඉක්මවා භාණ්ඩ නිකුත් කල අවස්ථා තිබුණි. | නිවැරදි කිරීමෙන් පසුව වන ශේෂය රු.මිලියන 26.72 ක් විය. එයින් රු. මිලියන 0.12 ක මුදලක් මේ වන විට එකතු කර ගෙන තිබුණි. | සමාගමෙහි ව්‍යාපාරික අරමුණු ඉටුකරගත හැකි වන පරිදි සමාගම් කළමනාකරණය ක්‍රියා කල යුතුය. |

## 2.11 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1970 අංක 33 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථා පනත යටතේ 1971 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද සී/ස ගොඩනැගිලි | ආයතනයේ පවතින අයහපත් මූල්‍ය | සමාගමේ අරමුණු හා |

| | | |
|---|---|---|
| ද්‍රව්‍ය සංස්ථාව 1992 වර්ෂයේ දී 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ද 2010 වර්ෂයේ දී 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ද නැවත ලියාපදිංචි කර තිබූ අතර එහි දැක්ම “ප්‍රමිතියට අනුකූලව උසස් ගුණාත්මකභාවයෙන් යුක්ත ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ තරඟකාරී මිලකට දීප ව්‍යාප්තව සැපයීමේ ප්‍රමුඛයා වීම හා රාජ්‍ය ආයතනයක් ලෙස සමාජ වගකීම් ඉටු කරමින් ශ්‍රී ලංකා ප්‍රජාව තුළ උපරිම විශ්වාසනීයත්වයක් ගොඩනැගීම” විය. එසේ වුවද වර්තමානය වන විට සමාගම සීමිත ව්‍යාපාර කටයුතු වල පමණක් නිරත වී තිබුණි.<br><br>සමාගමේ නවීකරණය කරන ලද ප්‍රධාන ප්‍රදර්ශනාගාරයේ පෞද්ගලික ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ සපයන්නන්ගේ අලෙවි කුටි ප්‍රදර්ශනය කර ඇති අතර ඔවුන්ගේ ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගෙන ලාභ ආන්තිකයක් ඇතිව විකිණීම, සමාගමේ ශාඛා කාර්යාල මඟින් ප්‍රධාන කාර්යාලයෙන් යවනු ලබන සිමෙන්ති, ෂීට් හා යකඩ නියම කරනු ලබන මිලකට විකිණීම, ප්‍රදර්ශනාගාරයේ නොමැති භාණ්ඩ බාහිර වෙළෙඳපොළෙන් මිලදී ගෙන ලාභ ආන්තිකයක් ඇතිව විකිණීම, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ නමින් වෙනත් ආයතන විසින් ආනයනය කල ටයිල් විකිණීම වැනි ව්‍යාපාරික කටයුතු මඟින් සමාගම පිහිටීමේ අරමුණුගත ප්‍රධාන කාර්යයන් ඒ ආකාරයෙන්ම ඉටු නොවන බැවින් සමාගමේ දැක්මද මෙමගින් ආවරණය වී නොතිබුණි. | තත්ත්වය හේතුවෙන් දැනට සිදු කෙරෙමින් පවතින වෙළඳ උපායමාර්ග කඩිනමින් වෙනස් කිරීම මගින් වඩාත් අහිතකර තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවිය හැක. එබැවින් පියවරෙන් පියවර අවිධිමත් ව්‍යාපාරික උපායන්ගෙන් ඉවත් වීමටත් ආයතනයේ අපේක්ෂිත මෙහෙවරට (mission) ප්‍රවේශ වීමටත් සැළසුම් සකස් කරනු ලැබේ. | දැක්ම අනුව කාර්යක්ෂමව හා ඵලදායීව කටයුතු මෙහෙයවීම කළමණාකරණ යේ වගකීම වන බව. |

## 2.12 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජූනි 30 දින වන විට සමාගමට එරෙහිව අධිකරණයේ නඩු 08 ක් විභාග වෙමින් පැවතුනද මේ වන විට නඩු 2 ක් හැර අනෙකුත් නඩු අවසන් වී තිබුණි. එම නඩු 2 ක සඳහා අධිකරණ නියෝග මත සමාගම විසින් ගෙවිය යුතු මුදලින් රු. මිලියන 8.48 ක මුදලක් අදාල පාර්ශවයන් වෙත තවදුරටත් ගෙවිය යුතුව තිබුණි. | මේ වන විට පවතින නඩු 2 පහත පරිදි වේ.<br>• MC 6785/17 EPF - රු. මිලියන 3.98 ක මුදලක් ගෙවීමට නියමිතව තිබූ අතර, මාසිකව රු. 50,000 බැගින් ගෙවා 2022.12.29 දිනට තවදුරටත් රු. මිලියන 1.13 ක (වාරික 23) මුදලක් ගෙවීමට ඉතිරිව තිබුණි.<br>• HC (Civil) 316/2003 (1) – සෑම මසකම රු. 100,000 බැගින් සමථ කොන්දේසි අනුව ගෙවීම් කර ගෙන | සමාගමට විරුද්ධව නඩු කටයුතු අවම වන පරිදි ආයතනයේ කටයුතු මෙහෙයවීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඉදිරියට රු. මිලියන 7.36 ක් (වාරික 74) ක් ගෙවීමට තිබුණි. | |
| (ආ) | දේශීය අවශ්‍යතාව සඳහා සිමෙන්ති ආනයනය වෙනුවෙන් සිමෙන්ති සමාගම් වෙතින් මිල ගණන් කැඳවා තිබුණ අතර කි.ග්‍රෑ. 50 "BMC" නාමය මුද්‍රනය කරන ලද කඩදාසි මළුවල බහා මෙට්‍රික් ටොන් 1 ක් ඇමරිකානු ඩොලර් 79.50 ක් බැගින් වූ සිමෙන්ති මෙට්‍රික් ටොන් 5600 ක් සැපයීම වෙනුවෙන් නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමකින් තොරව පෞද්ගලික සමාගමක් තෝරාගෙන තිබුණි. රාජ්‍ය අමාත්‍යාංශයෙන් අතිරේක ලේකම් (ඉදිකිරීම්) විසින් 2022 පෙබරවාරි 24 දිනැති අංක 7/2/2/651 දරණ ලිපිවලින් ගිවිසුම්ගත වන ලෙසටත් ඒ වෙනුවෙන් අත්තිකාරමේ මුදල් ලෙස රු.මිලියන 05 ක් ගෙවන ලෙසත් ලබාදුන් උපදෙස් මත 2022 මාර්තු 14 දින එවකට සිටි සභාපති විසින් සමාගම සමඟ ගිවිසුම්ගත වී කලින් තහවුරු කර ගැනීමකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් සිමෙන්ති ආනයනය සඳහා ගෙවා තිබූ රු. මිලියන 05 ක අත්තිකාරම් මුදල් නැවත අයකර ගැනීමට නොහැකි වී තිබුණි.<br><br>මෙම ගැටළුව සම්බන්ධයෙන් මූලික විමර්ශනය සිදු කිරීමට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම මත රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් පාලන අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරියෙකු පත්කර තිබුණි. ආනයන කටයුත්තේදී සමාගමට සිදු කල අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු ඉහත ගිවිසුම අත්සන් කල සේවයෙන් ඉවත්ව ගොස් ඇති නිලධාරින්ට එරෙහිව පොදු දේපල පනත යටතේ කටයුතු කර එම අලාභය අයකර ගැනීමට කටයුතු කරන ලෙස නිර්දේශ කර තිබුණද එම නිර්දේශයන්ද ක්‍රියාත්මක කිරීමට මේ වන තෙක්ම කටයුතු කර නොතිබුණි. | ආයතනය මගින් ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වීමක් සිදු නොවූ බැවින් මෙම තැන්පතුව නැවත ලබා දීම සැපයුම්කරු විසින් ප්‍රතික්ෂේප කර ඇත. මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ආයතනයේ නීති අංශ මගින් දැක්වූ කරුණු අනුව ප්‍රථමයෙන්ම වංචා විමර්ෂණ අංශයට/ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ අල්ලස් හෝ දූෂණ විමර්ශන අංශය වෙත පැමිණිලි කිරීමට කටයුතු කරනු ලැබේ. | පොදු දේපල පනත යටතේ ආයතනයට සිදු වූ අලාභය වෙනුවෙන් වගකිව යුතු පාර්ෂවයෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 2.13 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2005 ජූලි 19 හා 2006 ඔක්තෝබර් 03 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත කොළඹ 10, සංඝරාජ මාවතේ අංක 541හි පිහිටි අංක 1762 දරන පිඹුරේ කැබලි අංක A හා B දරන රූඩ් 03 පර්චස් 3.2ක් හා අංක 5107 පිඹුරේ ලොට් අංක A හි පර්චස් 15ක් සහ අංක 4365 පිඹුරුපතේ ලොට් අංක 01 හි ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 13.20ක ප්‍රමාණයක් සමාගම විසින් දේපළ වෙළඳාම් සමාගමකට රු.මි. 222.50 කට විකුණා තිබුණි.<br><br>එසේ වුවද 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත ප්‍රකාරව මෙම සමාගමට පවරාදීමේ අංක අත් 1/146 දරන සහතික පත්‍රයේ දෙවෙනි උපලේඛනයෙහි දැක්වෙන කොන්දේසි හා සීමා ප්‍රකාරව මෙම ඉඩම අදාළ අමාත්‍යාංශයේ නිසි අවසරය නොමැතිව අත්කරගත් කාර්යය හැර වෙනත් කාර්යයක් සඳහා නොයෙදිය යුතු බව සඳහන් වී තිබුණද එයට පටහැනිව අදාළ ඉඩම් කැබලි විකිනීමට කටයුතු කර තිබුණි.<br><br>මෙම දේපළවල නිරවුල් භුක්තිය ලබා ගැනීම සඳහා සමාගමට එරෙහිව එම දේපළ වෙළඳාම් සමාගම විසින් 2007 සැප්තැම්බර් මස 04 දින කොළඹ දිසා අධිකරණයේ නඩු අංක 25514/L යටතේ නෙරපීමේ නඩුවක් ගොනු කර තිබූ අතර, 2012 ජනවාරි 10 දින සමාගම විසින් රුපියල් මිලියන 359.32ක මුදලක් ඉහත ආයතනයට 2012 ජනවාරි 31 දිනට පෙර ගෙවා ඉඩම්වල අයිතිය නැවත පවරා ගැනීමට එකඟවීම මත, නඩුව සමථයට පත්වී තිබුණි. එහෙත් එකඟ වූ පරිදි අදාළ මුදල් සමාගම විසින් නොගෙවීම නිසා ඉඩම්වල නිරවුල් බුක්තිය ලබා ගැනීමට දේපළ වෙළඳාම් සමාගම මේ වන විට ක්‍රියා කර තිබුණි. | අදාල ඉඩම 2022 නොවැම්බර් මස අධිකරණ නියෝග මත භුක්තිය HDFC බැංකුව වෙත ලබා ගෙන ඇත.<br><br>අදාළ අමාත්‍යාංශයේ නිසි අවසරය නොමැතිව ආයතනය සතු ඉඩම් විකිණීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ඉදිරියේදී ගනු නොලබනු ඇත. | විධිමත් අනුමැතියකින් තොරව හා අරමුණින් බැහැරව පවරා දෙන ලද ඉඩම් විකිණීම සිදු නොකළ යුතු අතර සමාගම සතු වත්කම් නිසි පරිදි කලමනාකරණය කිරීමට වගබලා ගත යුතුය. |
| (ආ) | 1998 නොවැම්බර් 09 දිනැති අංක 541 ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 හි පිහිටි සමාගම සතු ඉඩමෙන් පර්චස් 100 ක ඉඩම් ප්‍රමාණයක් ලංකා බැංකුව වෙත රුපියල් මිලියන 70කට විකුණුම්කරයක් මගින් පවරා තිබූ අතර, පසුව | මුද්දර ගාස්තුව වූ රු. මිලියන 5.38 ක මුදල පිළිබඳව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව මගින් මත විමසුමක් ලබා ගන්නා ලෙස | අදාළ මුද්දර ගාස්තුව නිසි පරිදි ගෙවා ඉඩමෙහි අයිතිය පවරා ගැනීමට කළමණාකරණය |

| | | | |
|---|---|---|---|
| | සමාගම විසින් 2018 ඔක්තෝබර් මස 23 දින ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලද රුපියල් මිලියන 500ක ණය මුදලින් ඉහත විකුණුම්කරයට අදාළ මුදල වන රුපියල් මිලියන 70ක මුදල සමග ණය අයිරා මුදලද ඒ අනුව ගෙවිය යුතු පොලිය ද ඇතුළුව රු.මිලියන 199.05 ක මුදලක් හිලව් කරගෙන තිබුණි. ලංකා බැංකුව ඉහත සඳහන් මුදල් හිලව් කිරීමෙන් අනතුරුව බැංකුව විසින් සකස් කර එවා ඇති ඔප්පුවේ වටිනාකමට අදාල මුද්දර ගාස්තුව වූ රු.මිලියන 18.39 ක මුදල ගෙවා නැවත ඉඩම පවරාගත යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දින වන විටත් පවරා ගෙන නොතිබුණි. | ලංකා බැංකුව දැන්වීමෙන් පසු විමසීමේදී තක්සේරු මුද්දර ගාස්තුව රු. මිලියන 18.39 ක් ලෙස දන්වා ඇත. එය අඩු කර ගැනීමට පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත නැවත ඉල්ලීමක් කර ඇත. | කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාගම යටතේ ඇති අක්කර 03 රූඩ් 3.5 පර්චස් 17 ක් වටිනා මොරටුව, අනුරාධපුර, අම්පාර පිහිටි ඉඩම් වෙනුවෙන් ඔප්පු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඔප්පු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ගෙන යනු ලබයි. | හිමිකම් ඔප්පු සකස් කර ලියාපදිංචි කර ගැනීමට අදාල ආයතන සමඟ කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාගම සතු කුන්ගුනියාර් උප්පුකුලම් කරෛයි යාපනය පිහිටි රූඩ් 01 යි පර්චස් 31.6 ක් වූ ඉඩම සහ නුවරඑළිය බඹරකැලේ ගොඩනැගිල්ල සහ ඇඹිලිපිටිය යෝධගම නිවාස 02 ක් 2017 වර්ෂයේ සිට උපයෝජනය නොකර නිශ්ක්‍රීයව පවතී. | උපයෝජනය සඳහා යොදා ගැනීමට මූලික සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා නිර්දේශ කර ඇතත්, මේවන විට ආයතනයේ මූල්‍ය පහසුකම් නොතිබීම හේතුවෙන් තාවකාලිකව සංවර්ධන කටයුතු නවතා ඇත. | පවත්නා සම්පත් කාර්යක්ෂමව උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මහවැලි අධිකාරිය විසින් 50 අවුරුදු බද්දකට ලබාදී ඇති ඇඹිලිපිටිය රූඩ් 01 ක ඉඩම වෙනුවෙන් 1997 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා හිඟබදු මුදල හා දඩය රු. මිලියන 1.65 ක් විය. මෙම බදු මුදල් නොගෙවීම හේතුවෙන් බද්ද අවසන් විය හැකි බවටත්, නීතිය මඟින් කටයුතු කරන බවත් මහවැලි අධිකාරිය දන්වා එවා තිබුණි. | කොටස් වශයෙන් හිඟ බදු ගෙවා දැමීම සඳහා පියවර ගනු ලැබේ. | හිඟ බදුකුළිය ඇතුළුව බදුකුළී නිසියාකාරව ගෙවීමටත් එම ඉඩම් උපයෝජනය කිරීම තුලින් ආදායම් ඉපයීමටත් කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ජාතික ලොතරැයි මණ්ඩලයේ සේවා කටයුතු සඳහා අංක 541 ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි සමාගම් පරිශ්‍රයේ අංක 07 දරන ගබඩාව 2017 සැප්තැම්බර් 01 දින සිට වර්ග අඩි 1,513 ක් වර්ග අඩියක් රු. 55 බැගින් මාසිකව රු. 83,215 කටද, අංක 05 සහ 06 ගබඩා 2016 ඔක්තෝබර් 01 දින සිට වර්ග අඩියක් රු. 55 බැගින් වර්ග අඩි 1,568 ක් මාසිකව රු. 86,240 කටද අංක 01,02,03,04 යන ගබඩා 2015 මැයි 27 සිට වර්ග අඩියක් රු. 55 බැගින් වර්ග අඩි 3,136 ක් මාසිකව රු. 172,480 කටද ලබා දී තිබුණු අතර, ගිවිසුම් අළුත් කිරීමකින් තොරව 2015, 2016, 2017 වර්ෂවල මිලටම 2020 වර්ෂයේ ද එම ගබඩා කුලියට ලබා දී තිබුණි. මෙම ගබඩා සඳහා 2018 ජූලි සිට 2021 ජනවාරි දක්වා ගෙවිය යුතු රු. 60,382 ක් වූ විදුලි බිල්පත් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ගෙවා නොතිබුණු අතර, 2021 දෙසැම්බර් 31 දින ගබඩා නැවත භාරදී තිබුණි. | 2018 සිට 2021 දක්වා කාලය තුළ අප වෙත අය වීමට තිබූ රු. 60,382 ක මුදල පිලිබඳ අප විසින් එම ආයතනය දැනුවත් කලද ගිවිසුම් ගත වීමක් සිදුව නොමැති නිසාවෙන් එම මුදල ගෙවීමට නොහැකි බව ජාතික ලොතරැයි මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අප ආයතනය වෙත දන්වා ඇත.<br><br>නිශ්චිත ගිවිසුම් නොමැතිව ආයතනයේ පරිශ්‍ර බඳු දීමක් ඉදිරියේදී සිදු නොවීමට වග බලාගනු ඇත. | වත්කම් තක්සේරු කර ඒ අනුව කුලී ප්‍රමාණය යාවත්කාලීන කර විධිමත් ගිවිසුමක් යටතේ ගබඩාව කුලියට දිය යුතුය. |

**2.14 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් බැංකු ගිණුම් 10 ක් පවත්වාගෙන යනු ලබන අතර 2023 වර්ෂය සඳහා ආරම්භක සහ අවසාන ශේෂයන් සඳහන් කරමින් මුදල් පොත් කිසිවක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර බැංකු සැසඳුම් ප්‍රකාශද පිළියෙල කර නොතිබුණි. එම බැංකු ගිණුම් ශේෂ සනාථ කිරීම් අනුව බැංකු ගිණුම් 03 ක හර ශේෂය රු. මිලියන 33.49 ක් වූ අතර ගිණුම් 07 ක බැර ශේෂය රු. මිලියන 51.34 ක් විය. මේ හේතුවෙන් සමාගම ප්‍රමාණවත් පරිදි මුදල් පිළිබඳ පාලනයක් ක්‍රියාවේ යොදවා නොතිබුණි. | ජංගම ගිණුම් 2 ක් සඳහා 2022 වර්ෂය සඳහා ම මුදල් පොත හා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙළ වී ඇති අතර ඉතිරි ජංගම ගිණුම් සඳහා 2022 සැප්තැම්බර් මාසය තෙක් මුදල් පොත පිළියෙල වී ඇත.<br><br>2023 වර්ෂය සඳහා මුදල් පොත පිළියෙල කර ඇත. ඊට අදාළ බංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල වී නොමැත.<br><br>2024 වර්ෂයේ සියලු ම ජංගම ගිණුම් සඳහා මුදල් පොත පිළියෙල කර ඇති අතර බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කටයුතු යොදා ඇත. | වඩාත් නිවැරදිව ගණනය කර ගත් ආරම්භක ශේෂයක් පදනම් කරමින් මුදල් පොත් සහ බැංකු සැසඳුම් මාසිකව පිළියෙල කිරීමට කටයුතු කිරීමට කළමණාකරණය වහාම කටයුතු කල යුතු බව හා එය මූල්‍ය කළමණාකරණය සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීමක් වන බව. |

## 3. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අත්පොතෙහි පහත සඳහන් වගන්ති ප්‍රකාරව ආයතනය කටයුතු කර නොතිබුණි.<br><br>(i) 3.3 (i) ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br><br>(ii) 3.2 (i) ඡේදය ප්‍රකාරව ලබාගත යුතු නිසි අනුමැතිය ලබා ගත් බඳවා ගැනීමේ පරිපාටියක් සමාගම සතුව නොතිබුණි. | චක්‍රලේඛයේ වගන්ති ප්‍රකාරව කටයුතු කිරීමට මේ වන විට යොමුව ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ මුළු ප්‍රාග්ධනය මහා භාණ්ඩාගාරය විසින් යොදවා ඇති අතර 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමක් වේ. එහි සාංසමික ව්‍යවස්ථාවලියෙහි 78 වන වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයා හා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විමසා භාණ්ඩාගාර ලේකම් විසින් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය පත්කල යුතු වුවද අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම් ලිපි නිකුත්කර තිබුණේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයාගේ අනුමැතිය මත අමාත්‍යාංශ ලේකම් විසිනි. | වත්මන් සභාපති පත්කර ඇත්තේ භාණ්ඩාගාර ලේකම් විසිනි. අනිකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කිරීමට ඇත. | සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම් සිදු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 උපායමාර්ග සැලැස්ම /ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 වගන්තිය ප්‍රකාරව සමාගමේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා උපායමාර්ගික සැලැස්මක් හා ඊට අනුරූපීව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර සෑම මුදල් වර්ෂයක් ආරම්භ වීමට දින 15 කට පෙර අදාළ සැලසුම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ කර නොතිබුණි. මාර්ගෝපදේශය ප්‍රකාරව සමාගමෙහි කාර්යසාධනය සම්බන්ධයෙන් තහවුරුවක් ලබා ගනිමින් අවශ්‍ය අවස්ථාවන්හිදි මහා භාණ්ඩාගාරය සමඟ එහි ගැටළු සහගත තත්ත්වයන් පිලිබඳ සාකච්ඡා කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | 2023.10.11 දින වර්ෂ 2024 සිට 2026 දක්වා උපායමාර්ගික සැලැස්මක් හා ඊට අනුරූපීව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර රේඛීය අමාත්‍යාංශයට භාර දී ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව උපායමාර්ගික සැලැස්මක් හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කළමනාකරණය විසින් කටයුතු කළ යුතුය. |

## 4.2 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නිර්දේශය ක්‍රියාත්මක නොකිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 අප්‍රේල් 19 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවෙන් ආයතනයේ සේවය කරන සේවක සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කිරීම සඳහා ලබා දී තිබූ නිර්දේශය 2024 අගෝස්තු 14 විගණිත දින දක්වාම ක්‍රියාත්මක වී නොතිබුණි. | ආයතනයේ සේවක සංඛ්‍යාව ඇතුලත් කර යෝජිත කාර්ය මණ්ඩල ඇස්තමේන්තුවක් සකස්කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කර ඇත. | සේවක සංඛ්‍යාව කලමනාකරණ සේවා දෙපාර්තමේන්තු වෙන් අනුමත කරගත යුතුය. |
| (ආ) | පොදු ව්‍යාපාර කාරක සභා නිර්දේශ ප්‍රකාරව බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. | ජංගම ගිණුම් 2 ක් සඳහා 2022 වර්ෂය සඳහා මුදල් පොත හා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙළ වී ඇති නමුත් සෙසු ජංගම ගිණුම් සඳහා 2022 සැප්තැම්බර් මාසය තෙක් මුදල් පොත පිළියෙල වී ඇත.<br><br>2023 හා 2024 වර්ෂ වෙනුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා කටයුතු යොදා ඇත. | වඩාත් නිවැරිදිව පිළියෙල කරන ලද මුදල් පොත පදනම්ව මාසිකව බැංකු සැසඳුම් පිළියෙල කිරීමට කළමනාකරණය වහාම කටයුතු කල යුතුය. |
| (ඇ) | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ප්‍රකාරව 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන සකස් කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කෙරෙමින් පවතින අතර එය අවසන් වූ පසු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර විගණනය සඳහා භාර දීමට නියමිතව ඇත. 2020,2021,2022 හා 2023 වර්ෂ සඳහා වන මූල්‍ය තොරතුරු, ගිණුම්කරණ තොරතුරු පද්ධතියට ඇතුළත් කරමින් පවතින අතර ඒවා අවසන් වූ පසු වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පියවර ගනු ලැබේ. | නිවැරදි ගිණුම්කරණ දත්ත මත පදනම්ව වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |

## 4.3 අභ්‍යන්තර විගණනය හා විගණන කළමනාකරණ කමිටු පැවත්වීම.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දින 2023 වර්ෂයට අදාලව සභාපතිවරයා විසින් අනුමත කර එවා තිබූ විගණන සැලැස්ම අනුව | අමාත්‍යාංශය විසින් ගිණුම් පිළියෙළ කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයේ සහාය ලබා ගත් බැවින්, විගණන සැලැස්මට අදාල බොහෝ | අනුමත විගණන සැලැස්ම ප්‍රකාරව වාර්ෂික අභ්‍යන්තර |

| | | |
|---|---|---|
| 2023 වර්ෂයේ ඉටුකල යුතු යැයි නිශ්චිතව හඳුනාගත් ක්‍රියාකාරකම් වලින් සියයට 73 ක් අදාල කාලපරිච්ඡේදයේදී ඉටුකර නොතිබුණි. | කටයුතු මගහැරී ඇත. | විගණන ක්‍රියාකාරකම් ඉටුකල යුතුය. |